(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 16.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2019 ජනවාරි 10 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, 2019 ජනවාරි 11 වැනි සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.30 සිට අ.භා. 7.30 දක්වා විය යුතු ය. අ.භා. 6.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2019 ජනවාරි 11 වැනි සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 සැප්තැම්බර් 11 දිනැති අංක 2088/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— උද්ධෘත පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධෘත පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තුර්කි ජනරජය අතර උද්ධෘත ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 13 දිනැති අංක 2079/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***